ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretriat,1200/6, Rajamalwatta Road, Battaramulla.

☎ 011 279 7400
🖷 011 286 4051

මගේ අංකය / எனது இல / My No. LCGD/AD/7/7/1 (2020)

ඔබේ අංකය / உமது இல / Your No

දිනය / திகதி / Date 2020.02. 26

**චක්‍රලේඛ අංක 2020/8**

සියළුම ප්‍රාදේශීය ලේකම්වරු

සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරු

ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස්වරු (අන්තර් පළාත්)

## <u>බෞද්ධ විහාරස්ථාන සඳහා රජයේ ඉඩම් ලබාදීම</u>

රජයේ ඉඩම් ආඥා පනත යටතේ බෞද්ධ විහාරස්ථාන සඳහා ඉඩම් ලබාදීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති මාගේ 2008.10.28 දිනැති 2008/5 චක්‍රලේඛය මෙයින් අවලංගු කරන අතර එම චක්‍රලේඛයෙහි තිබූ කරුණු ඇතුළත් කර පරිශීලනයේ පහසුව සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරන බැවින් ඒ අනුව කටයුතු කළ යුතු වේ. රජයේ ඉඩම් ආඥා පනතේ ඉඩම් නියෝග 200:3 හි උපදෙස් අනුව බෞද්ධ විහාරස්ථානයක් සඳහා ඉඩම් ලබාදීමේදී වැඩ පියවර 3ක් අනුගමනය කිරීමට සිදුවේ.

i. ව්‍යවස්ථානුකූලව පිහිටුවා ගන්නා භාරකාර මණ්ඩලයට ප්‍රාරම්භක බදුකරයක් නිකුත් කිරීම.
ii. භාරකාර මණ්ඩලය විසින් පූජා ඔප්පුවක් සකස් කර විහාරාධිපතිහිමියන්ට පූජා කිරීම.
iii. අතිගරු ජනාධිපතිතුමා විසින් විහාරාධිපතිහිමියන්ට නිදහස් දීමනා පත්‍රයක් ප්‍රදානය කිරීම.

02. මේ වනවිට විහාරස්ථානයක් සඳහා අවශ්‍ය අංගෝපාංග සංවර්ධනය කර ඇති හා විහාරාධිපතිහිමියෙකු පත්කර ඇති, විහාරස්ථානයක් ලෙස පවත්වාගෙන යන විහාරස්ථාන සඳහා ඉහත වැඩ පියවර ක්‍රියාත්මක කිරීමට සිදුවීම මගින් සිදුවන අනපේක්ෂිත ප්‍රමාදයන් වළක්වා රජයේ ඉඩම්වල පිහිටා ඇති විහාරස්ථානවලට අදාළ ලේඛන විධිමත්ව කඩිනමින් ලබාදීම මෙහි අරමුණ වේ. ඇතැම් බෞද්ධ විහාරස්ථාන සඳහා නැවත භාරකාර මණ්ඩල පත් කිරීමට සිදුවීම, පත් කළ භාරකාර මණ්ඩල ක්‍රියාත්මක නොවීම, භාරකාර මණ්ඩල විසින් විහාරාධිපතිහිමියන් වෙත ඉඩම් පූජා කිරීම ප්‍රමාද කිරීම, ප්‍රාරම්භක බදුකරයේ බදු මුදල් නොගෙවීම නිසා ප්‍රාරම්භක බදුකරය සකස් කිරීමට නොහැකි වීම, ඇතැම් විහාරස්ථාන සඳහා ප්‍රමාණවත් ආදායමක් නොමැති නිසා බදු ගෙවා ගැනීමට නොහැකි වීම වැනි කරුණු මත එම ඉඩම්වල අයිතිය තහවුරු කිරීම තවදුරටත් ප්‍රමාද වන බව නිරීක්ෂණය වී ඇත.

03. මෙම හේතු සැලකිල්ලටගෙන දැනටමත් සංවර්ධනය අවසන් කර ඇති විහාරස්ථාන සහ විහාරාධිපතිහිමියෙකු පත්කර ඇති බෞද්ධ විහාරස්ථාන සඳහා ඉහත සඳහන් වැඩ පියවර i හා ii සඳහන් අවශ්‍යතාවයන් ඉවත්කර සෘජුවම නිදහස් දීමනාපත්‍රයක් ලබාදීම සඳහා යෝජනාවක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර ඊට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත. මේ අනුව එවැනි සංවර්ධිත විහාරස්ථාන සම්බන්ධව පහත සඳහන් කඩිනම් පියවර ගෙන අදාළ වාර්තා නොපමාව පළාත් ඉඩම් කොමසාරිස්/ (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස් මගින් මා වෙත යොමු කිරීමට පියවර ගන්නා මෙන් උපදෙස් දෙමි.

04. (i) **දැනට අයිතිය සම්බන්ධ කිසිදු ලියවිල්ලක් නිකුත් කර නොමැති එහෙත් බෞද්ධ විහාරස්ථානයක් සඳහා අවශ්‍ය සංවර්ධන කටයුතු නිමකර විහාරාධිපතිහිමියන් පත්කර ඇති බෞද්ධ විහාරස්ථාන**

මෙවැනි විහාරස්ථාන පිහිටි ඉඩම් සඳහා විහාරාධිපතිහිමියන් නමින් නිදහස් දීමනාපත්‍රයක් නිකුත් කිරීම සඳහා ආ.ඒ.ආ 118 දරණ ආකෘතියෙන් "O" රේඛා චිත්‍රයක් ලබා ගැනීම සඳහා මැනුම් නියෝගයක් නිකුත්කර පහත සඳහන් වාර්තා මා වෙත එවන්න. (ඉඩම් මේ වනවිට මැනුම්කර මූලික පිඹුරක් පිළියෙල කර නොමැති නම් පළමුව ආ.ඒ.අ. 08 න් මැනුම් ඉල්ලීමක් යවා පිඹුරක් පිළියෙල කර ගැනීම අවශ්‍යය.)

- ❖ බෞද්ධ විහාරස්ථානයක් සඳහා අවශ්‍ය අංගෝපාංග සංවර්ධනය කර ඇති බවට ප්‍රාදේශීය ලේකම්/ (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස්ගේ සහතිකය.
- ❖ විහාරාධිපතිහිමියන් පත් කළ බවට බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයා නිකුත් කළ සහතිකයේ පිටපත. මෙම සහතිකය තවමත් නිකුත් වී නොමැති නම් විහාරාධිපතිහිමියන් පත් කළ බවට අදාළ නිකායේ මහා නායකහිමියන් විසින් නිකුත් කළ අධිකාර පත්‍රය.
- ❖ විහාරාධිපතිහිමියන් අයත් වන නිකාය සහ එම නිකායේ මහ නායක ස්වාමීන් වහන්සේගේ නම.
- ❖ ප්‍රාදේශීය ලේකම්/ (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස්ගේ නිර්දේශය.

(ii) **දැනට ප්‍රාරම්භක බදුකරයක් නිකුත් කර ඇති බෞද්ධ විහාරස්ථාන**

දැනට ප්‍රාරම්භක බදුකරය නිකුත් කර ඇති, බදු නොගෙවීම නිසා අක්‍රිය වී ඇති, මූලික බදු මුදල නොගෙවීම නිසා බදුකරය තවම නිකුත් නොකළ, බෞද්ධ විහාරස්ථානවල එම බදු මුදල් කපා හැරීමට අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් අනුමැතිය ලැබී ඇති නිසා මෙවැනි බදුකර ලියවිලි ආපසු රජයට භාරගෙන අවලංගු කිරීම සඳහා මා වෙත එවීමට කටයුතු කරන්න. ඒ සමඟ ඉහත 04. (i) කොටසේ සඳහන් වාර්තාද එවීමට කාරුණාකර කටයුතු කරන්න.

(iii) **දැනට පූජා ඔප්පුවක් නිකුත් කර ඇති බෞද්ධ විහාරස්ථාන**

මෙවැනි විහාරස්ථාන සඳහා නිදහස් දීමනාපත්‍ර නිකුත් කිරීමට කිසිදු බාධාවක් නොමැති අතර එවැනි බෞද්ධ විහාරස්ථාන සඳහා නිදහස් දීමනාපත්‍රයක් ලබා දීම සඳහා අවශ්‍ය මැනුම් නියෝග යවා "O" රේඛා චිත්‍රයක් මා වෙත ලැබීමට සලස්වා ඒ සමඟ ඉහත 04. (i) කොටසේ සඳහන් වාර්තා නොපමාව මා වෙත එවීමට කටයුතු කරන්න.

ආර්.එම්.සී.එම්. හේරත්,
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් :

1. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය - කරු.දැ.ගැ.පි.
2. ලේකම්, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.පි.
3. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය - කරු.දැ.ගැ.පි.
4. මැනුම්පති, මිනින්දෝරු දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.පි.
5. බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.පි.
6. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය